සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

**08 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **කාලය : පැය දෙකයි**

නම / විභාග අංකය :

## I - කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවාවක් නොවන්නේ,

1. තැපැල් හා විදුලි පණිවුඩ සේවා  2. බැංකු සේවා
3. සමූපකාර සේවා  4. ප්‍රවාහනය

(02) අතීතයේ දී ගම් දහයකට එක් වෛද්‍යවරයෙකු බැගින් පත් කරමින් රාජ්‍යය පාලනය කළ රජ කෙනෙකි,

1. මහසෙන් රජු  2. දේවානම්පියතිස්ස රජු
3. වළගම්බා රජු  4. බුද්ධදාස රජු

(03) බෝ නොවන රෝග වැළැක්වීම අරමුණු කරගනිමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා පිහිටුවා ඇත්තේ,

1. සුවදිවි මධ්‍යස්ථාන  2. සුවසැරිය මධ්‍යස්ථාන
3. සුව දිරිය මධ්‍යස්ථාන  4. සුව සහන මධ්‍යස්ථාන

(04) අධ්‍යාපනය ලබා දෙන ප්‍රධාන ආයතනය වන්නේ,

1. පන්සල  2. පාසල  3. පෞද්ගලික පන්ති  4. දහම් පාසල

(05) රජය විසින් නොමිලේ සපයනු ලබන පොදු සේවාවක් වන්නේ,

1. පණිවුඩ හුවමාරුව  2. ජල සම්පාදනය
3. ප්‍රවාහනය  4. අධ්‍යාපනය

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

(භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය / වැඩ මූලික / ''එකා සැමටත් - සැම එකාටත්'' / වැඩ භාර නිලධාරීන් / සැමට සෙවණ)

(06) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයට .............................. .............................. අයත් වේ.

(07) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් ඩිපෝවක සේවා සැපයීමට දායක වන කාර්යය මණ්ඩලයට .............................. අයත් වේ.

(08) පරිසර සංරක්ෂණය සඳහා .................................................................................. රජය මගින් පිහිටුවා ඇති ආයතනයකි.

(09) ..................................................................................... සමාජ ආරක්ෂණ ජාල යටතේ ක්‍රියාත්මක වැඩසටහන් සඳහා නිදසුනකි.

(10) ........................................................................................ යනු සමූපකාරයේ ආදර්ශ පාඨය වේ.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

(11) ලලිත් ඇතුලත්මුදලි මහතා නිදහස් අධ්‍යාපනයේ පියා වේ. (..........)

(12) පාසල් සිසුන් සඳහා 'සිසු සැරිය' ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් සපයනු ලබන සේවාවකි. (..........)

(13) වර්තමානයේ බහුලව දැකිය හැක්කේ විස්තෘත පවුල් ය. (..........)

(14) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව අවුරුදු 18 ට අඩු පුද්ගලයින් ළමුන් වේ. (..........)

(15) 'මල් වැඩීම' මනස සන්සුන් කිරීමේ අභ්‍යාසයකි. (..........)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල (අ) කොටසට ගැළපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය (අ) කොටස ඉදිරියෙන් ඇති වරහන තුළ ලියා දක්වන්න.**

| (අ) කොටස | | (ආ) කොටස |
|---|---|---|
| (16) බහු සංස්කෘතික සමාජ පවතින රටකි. | (..........) | A) පාස්කු උත්සවය |
| (17) ජේසු සමිඳාණන්ගේ නැවත උත්ථානය වීම සමරනු ලබයි. | (..........) | B) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| (18) හින්දි හා ඉංග්‍රීසි භාෂා රාජ්‍ය භාෂාවන් ලෙස භාවිත කරනු ලබන රටකි. | (..........) | C) බ්‍රිතාන්‍යය |
| (19) ස්වභාවික විපතකි. | (..........) | D) ඉන්දියාව |
| (20) අනතුරු හා ආපදා සම්බන්ධව කටයුතු කරන ආයතනයකි. | (..........) | E) ලැව් ගිනි |

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. (පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරාගනු ලබන අනෙක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.)

---

(01) 1. පොදු සේවා මහජනතාව වෙත සපයන ආකාරය අනුව වර්ග කෙරේ. ඉන් දෙකක් දක්වන්න.

2. ස්වභාවය අනුව පවුලක් වර්ග දෙකකට බෙදිය හැකිය. එම වර්ග දෙක නම් කරන්න.

3. හදිසි අවස්ථාවක දී අපට සහය ලබා ගත හැකි කෙටි දුරකථන අංක දෙකක් සඳහන් කරන්න.

4. පාසල තුළ දකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න.

5. පොලිස් ස්ථානයක කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න.

6. සමාජය තුළ නායකත්ව ලක්ෂණ දකිය හැකි අවස්ථාවන්ට උදාහරණ දෙකක් ලියන්න.

7. ඒකාධිපති නායකත්ව ශෛලියේ ලක්ෂණ දෙකක් ලියන්න.

8. සංස්කෘතිය යනු කුමක් ද?

9. ශ්‍රී ලංකාවේ බොහෝ අකුණු කුණාටු ඇතිවිය හැකි මාස දෙකක් නම් කරන්න.

10. රසායනික ද්‍රව්‍යය භාවිතයට ගනු ලබන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(ල. 2 x 5 = 10)

(02) 1. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය යහපත් තත්ත්වයක් අත් කර ගැනීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 02)

2. බෝ නොවන රෝග වළක්වා ගැනීමට මහජනතාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ල. 03)

3. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් ඔබ ප්‍රදේශයට සැපයෙන සේවාවන් පහක් ලියා දක්වන්න. (ල. 05)

(03) 1. පවුල තුළ දකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

2. පවුලේ සියලු දෙනා එක්ව සාකච්ඡා කර තීරණ ගත යුතු අවස්ථා සඳහා උදාහරණ තුනක් ලියන්න. (ල. 03)

3. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් පහක් ලියන්න. (ල. 05)

(04) 1. අධ්‍යාපනය ලැබීම යන අයිතිවාසිකමට අදාළව ඔබෙන් ඉටු විය යුතු යුතුකම් දෙකක් ලියන්න. (ල. 02)

2. ප්‍රාදේශීය මට්ටමින් දරුවන් හා පවුල් සඳහා සේවා සපයන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු නම් කරන්න. (ල. 03)

3. දරුවන්ට සමාන අවස්ථා අහිමි වීමටත්, විවිධ පීඩාවන්ට ගොදුරු වීමටත් බලපාන කරුණු පහක් ලියා දක්වන්න. (ල. 05)



CamScanner

(05) 1. ඊ.බී. ටයිලර් නම් සමාජ හා මානව විද්‍යාඥයා විසින් සංස්කෘතිය පිළිබඳව ඉදිරිපත් කළ නිර්වචනය ලියා දක්වන්න. (ල. 02)

2. බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

3. ජාතික සමගිය හා තිරසාර සාමය ගොඩනගා ගැනීමේ වාසි පහක් ලියා දක්වන්න. (ල. 05)

(06) 1. මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන විපත් දෙකක් නම් කරන්න. (ල. 02)


2. ස්වභාවික විපත් ඇතිවීමට බලපාන ප්‍රධාන හේතු දෙකක් දක්වා ඒවාට උදාහරණය බැගින් ලියා දක්වන්න. (ල. 03)

3. ඖෂධ භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පහක් ලියා දක්වන්න. (ල. 05)

(07) 1. මාර්ග අනතුරු ඇතිවීමට බලපාන මූලික හේතු දෙකක් ලියන්න. (ල. 02)

2. පහත දක්වෙන මාර්ග සංඥාවලින් කියැවෙන අර්ථය ලියා දක්වන්න. (ල. 03)


(A)


(B)


(C)

3. මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා රියැදුරන්ගේ වගකීම් පහක් දක්වන්න. (ල. 05)

**දෙවන වාර පරීක්ෂණය**

**08 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | **විසඳුම් පත්‍රය**

## I - කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. 3 | 02. 4 | 03. 1 | 04. 2 | 05. 4 |
| 06. වැඩභාර නිලධාරීන් | 07. වැඩ මූලික | 08. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | | |
| 09. සැමට සෙවණ | 10. එකා සැමටත් - සැම එකාටත් | | 11. x | 12. ✓ |
| 13. x | 14. ✓ | 15. ✓ | 16. C | 17. A |
| 18. D | 19. E | 20. B | | (ලකුණු 2 x 20 = 40) |

## II - කොටස

(01) 1. නොමිලේ සපයනු ලබන පොදු සේවා, සහනදායී අයකිරීමේ පදනම මත සපයනු ලබන පොදු සේවා, මුදල් අයකර සපයනු ලබන පොදු සේවා

2. න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල

3. 110 - ගිනි නිවීම, 119 - පොලීසිය, 118 - ජාතික ආරක්ෂාව පිළිබඳ මෙහෙයුම් මධ්‍යස්ථානය

4. නායකත්වයට ගරු කිරීම, සහයෝගයෙන් කටයුතු කිරීම, උපේක්ෂාවෙන් ජය පරාජය විඳදරා ගැනීම, පාසල තුළ ඇති පොදු නීතිරීති හා සම්ප්‍රදායන් පිළිගැනීම හා ආරක්ෂා කිරීම

5. පොලිස් ස්ථානාධිපති, පොලිස් පරීක්ෂකවරුන්, උප පොලිස් පරීක්ෂකවරුන්, පොලිස් සැරයන්වරුන්, පොලිස් කොස්තාපල්වරුන්, කාන්තා පොලිස් නිලධාරිනියන්

6. ආගමික නායකයින්, ප්‍රජා නායකයින්, දේශපාලන නායකයින්, ආයතන ප්‍රධානීන්

7. පොදු ජනතා අදහස් නොපිළිගැනීම, වෙනස් වීමට කැමති නොවීම, ඉතා දැඩිව ක්‍රියා කිරීම, ඒකමතිකව තීරණ ගැනීම, තර්ජනය කිරීම, බිය ගැන්වීම, දක්ෂතා වර්ධනයට ඉඩ නොදීම

8. මිනිසා විසින් අයත් කරගෙන ඇත්තාවූ දැනුම, විශ්වාසය, කලාව, සිරිත් විරිත්, ජීවනෝපාය ආදී සියල්ල සංස්කෘතිය යි.

9. මාර්තු - අප්‍රේල් / ඔක්තොම්බර් - නොවැම්බර්

10. සනීපාරක්ෂක කටයුතු සඳහා, ගෙවතු වගාකටයුතු සඳහා, පාසල් විද්‍යාගාරවල පර්යේෂණ කටයුතු සඳහා, කෘමි මර්දන කටයුතු සඳහා, කෘෂිකාර්මික කටයුතු සඳහා, කර්මාන්තශාලාවල අමුද්‍රව්‍යයක් ලෙස (ල. 2 x 10 = 20)

(02) 1. සෞඛ්‍ය සේවාව රජය මගින් නොමිලේ සැපයීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය අත් කර ගත් දියුණුව, සෞඛ්‍ය සේවා දීප ව්‍යාප්තව සැපයීම, පොදුජන සහයෝගය (ල. 02)

2. වෛද්‍ය උපදෙස් පිළිපැදීම, යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම, සෞඛ්‍යාරක්ෂිත ආහාරපාන භාවිතය, ප්‍රමාණවත් ව්‍යායාමවල නිරත වීම, දුම් බීමෙන් හා මත්ද්‍රව්‍යවලින් වැළකීම (ල. 03)

3. බෝ නොවන රෝග මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ළදරු හා මාතෘ සායන පැවැත්වීම, ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීම, පාසල් සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ල. 05)

(මුළු ල. 10)

(03) 1. ආදරය හා රැකවරණය නොඅඩුව ලැබීම, සාකච්ඡා මගින් තීරණවලට එළැඹීම, සාමකාමීව ගැටළු නිරාකරණය කර ගැනීම, සාමූහිකව නිවසේ කටයුතුවලට හවුල් වීම, සමානාත්මතාවයෙන් කටයුතු කිරීම, අන් මත ඉවසීම හා සවන් දීම, දෙමාපිය වැඩිහිටි නායකත්වයට ගරු කිරීම, තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කිරීම (ල. 02)

2. විවිධ උත්සව කටයුතු සංවිධානය, ඉඩමක් / නිවසක් මිලදී ගැනීම, නිවසක් තැනීම / වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම, වාහනයක් මිලදී ගැනීම, විවාහ තීරණය කිරීම (ල. 03)



CamScanner

3. සාහිත්‍ය සමිති / ආගමික සමිති / ක්‍රීඩා සමිති / විෂයානුබද්ධ සමිති පැවැත්වීම, ජාතික උත්සව / ආගමික උත්සව / ක්‍රීඩා උත්සව / සංස්කෘතික උත්සව සංවිධානය, ශිෂ්‍ය නායක / පන්ති නායක / විෂය නායක / ක්‍රීඩා නායක වශයෙන් වගකීම් පැවරීම, නර්තනය / ගායනය / වාදනය / චිත්‍ර ඇඳීම / සාමාන්‍ය දැනීම / රචනා / විවාද වැනි තරඟ සංවිධානය කිරීම හා පැවැත්වීම, ශිෂ්‍යභට / පරිසරභට / බාලදක්ෂ / ප්‍රථමාධාර සේවා පුහුණු වීම් හා අත්දැකීම් ලබා දීම, අධ්‍යාපන චාරිකා / ක්ෂේත්‍ර චාරිකා / ගවේෂණ චාරිකා / විනෝද චාරිකා සංවිධානය කිරීම (ල. 05)
(මුළු ල. 10)

(04) 1. හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරත වීම, ගුරු දෙගුරුන්ට ගෞරව කිරීම, පාසලේ විනය නීතිරීති හා සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම (ල. 02)

2. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී, ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී, මුල් ළමාවිය සංවර්ධන නිලධාරී, ළමා හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ උපදේශන නිලධාරී, සමාජ සේවා නිලධාරී, කාන්තා සංවර්ධන නිලධාරී, අවිධිමත් අධ්‍යාපන හා විධිමත් අධ්‍යාපනය පිළිබඳ නිලධාරී (ල. 03)

3. මව්පියන් වෙන්වීම, මිය යෑම, විදේශගත වීම, සිරගත වීම, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම, දරුවන්ට අවධානය හා සැලකිල්ල අඩු වීම, දරිද්‍රතාවය (ල. 05)
(මුළු ල. 10)

(05) 1. සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අයත් කරගන්නාවූත්, ලබා ගන්නාවූත් දැනුම, විශ්වාසය, කලා, සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය වේ (ල. 02)

2. විවිධ ජනවර්ග ජීවත් වීම, විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වීම, විවිධ භාෂා කතා කරන ජන කොටස් ජීවත් වීම, විවිධ සිරිත් විරිත් දක්නට ලැබීම, විවිධ සංස්කෘතික උරුම පැවතීම (ල. 03)

3. එකිනෙකා අතර අවබෝධය ඇති වී විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම නිසා ගැටුම් අවම වීම, ජන කොටස් අතර සමගිය තහවුරු වේ. රට සංවර්ධනය කිරීම සඳහා සියලු දෙනාගේ දායකත්වය ලැබේ. එකමුතුව හා සාමූහිකව කටයුතු කිරීමට පෙළඹීමක් ඇති වේ. ඵලදායී ආර්ථික කටයුතුවල යෙදෙමින් රට සංවර්ධනය කිරීමට දායක වේ. සංස්කෘතික විවිධත්වයට ගරු කිරීමට හා එකිනෙකාගේ යුතුකම් හා වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට පෙළඹෙයි. (ල. 05)
(මුළු ල. 10)

(06) 1. රිය අනතුරු, රසායනික ද්‍රව්‍ය අනිසි භාවිතය, අනාරක්ෂිත ඉදිකිරීම්, පතල් හා කැනීම් කටයුතු, තාක්ෂණික විද්‍යුත් මෙවලම් අවභාවිතය, අක්‍රමවත්ව කැලි කසළ බැහැර කිරීම, ආරක්ෂිත උපක්‍රම අනුගමනය නොකිරීම (ල. 02)

2. පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලි - උදා - සුනාමි, භූ කම්පා, භූ චලන
කාලගුණික හා දේශගුණික විපර්යාස - උදා - ගංවතුර, නියඟ, කුණාටු, අකුණු, සුළි සුළං, ලැව්ගිනි, එල්නිනෝ, ලානිනෝ
(හේතු දෙකක් දැක්වීමට ල. 02, උදාහරණ දෙකකට ල. 01) (ල. 03)

3. නියමිත වෛද්‍ය උපදෙස් පිළිපැදීම, ඖෂධවල නියමිත මාත්‍රාව භාවිතය, නියමිත වේලාවට ඖෂධ භාවිතය, කල් ඉකුත්වීමේ දිනය පිළිබඳව සැලකිලිමත් වීම, නියමිත උෂ්ණත්වයේ ගබඩා කිරීම, ඇසුරුමයේ උපදෙස් පිළිපැදීම, අන්තරායකාරී ඖෂධ භාවිතයෙන් වැළකීම (ල. 05)
(මුළු ල. 10)

(07) 1. රියදුරන් අතින් සිදුවන වැරදි, පදිකයන් අතින් සිදුවන වැරදි, මාර්ගවල අඩුපාඩු, වාහනවල නුසුදුසු ධාවන තත්ත්වය (ල. 02)

2. A) පහළට අවධානම් බෑවුම ඉදිරියෙන් B) ආරක්ෂිත දුම්රිය හරස් මාර්ගය ඉදිරියෙන්
C) පදිකයින් මාරුවන ස්ථානය ඉදිරියෙන් (ල. 03)

3. මාර්ග නීතිරීති නිසි පරිදි පිළිපැදීම, මාර්ග සංඥා නිසි පරිදි පිළිපැදීම, බීමත්ව රිය පැදවීමෙන් වැළකීම, නියමිත වේග සීමාව ඉක්මවා නොයෑම, ධාවනයේ යොදවන වාහන මැනවින් නඩත්තු කිරීම, අයහපත් කාලගුණික තත්ත්වවලදී ප්‍රවේශමෙන් රිය පැදවීම, මෝටර් රථවල ගමන් කිරීමේ දී ආරක්ෂිත පටි පැළඳීම යනාදී... (ල. 05)
(මුළු ල. 10)



CamScanner